## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013

(නව නිර්දේශය)

2016 අගෝස්තු - ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

### දර්ශනය - **PHIL - E 3015**

### සාමාන්‍ය මනෝවිද්‍යාව

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. නූතන මනෝවිද්‍යාව බිහිවීමේ සිට වර්තමානය දක්වා මනෝවිද්‍යා විෂයෙහි ඉලක්ක හා අරමුණු ( goals and objectives) ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය විමර්ශනය කරන්න.

02. සමාජ මනෝවිද්‍යාවේ හෝ පරිසර මනෝවිද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විස්තරාත්මකව ඉදිරිපත් කරන්න.

03. "නූතන මනෝවිද්‍යාවෙහි බොහෝ සංකල්ප බුද්ධිවාදී හා අනුභූතිවාදී දාර්ශනිකයන් විසින් ගොඩනගනු ලැබ ඇත." මෙම ප්‍රකාශයට පක්ෂව **හෝ** විපක්ෂව තර්ක කරන්න.

04. සම්භාව්‍ය ආරෝපන රාමුව තුළ චර්යා ඉගෙනීම කෙසේ සිදුවේදැයි පහදන්න.

05. **එක්කෝ**
අභිප්‍රේරණ සංකල්පය විස්තර කරමින් ඔබ කැමති අභිප්‍රේරණ න්‍යායයක් විස්තර කරන්න.

**නැතහොත්**
විඥානය තවදුරටත් විද්‍යාත්මක නොවන සංකල්පයක් වශයෙන් සලකනු ලැබීම සාධාරණද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

06. හැන්ස් අයිසෙන්ක්ගේ **හෝ** රේමන්ඩ් කැටිල්ගේ පෞරුෂ න්‍යායයෙහි මූලික සංකල්පය විස්තර කරන්න.

07. මතකය පිළිබඳ ත්‍රිවිධ පියවර ආකෘතිය ඉදිරිපත් කරමින් විශ්ලේෂණය කරන්න.

08. **එක්කෝ**
බුද්ධිය හුදු ශාස්ත්‍රීය රාමුවකට සීමා කිරීම පිළිබඳ ඔබ එකඟ වන්නෙහිද? බුද්ධිය පිළිබඳ නවීන නිර්වචන ආශ්‍රයෙන් පිළිතුරු දෙන්න.

**නැත්නම්**
සමකාලීන මනෝවිද්‍යාවෙහි චිත්තවේග කළමනාකරණය යනුවෙන් කුමක් අදහස් වෙයිද? අදාළ සංකල්පය හා මූලධර්ම ආශ්‍රයෙන් පහදන්න.

*******************